අනුමාන ප්‍රශ්න පත්‍රය (Guessing Question Paper) 2021

**නව නිර්දේශය**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**බුද්ධ ධර්මය II**

| 41 | S | II |
|---|---|---|

**පැය තුනයි**

**අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10**

පළමු කොටසින් ප්‍රශ්න **දෙකක් ද** දෙවන කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### I කොටස

01 1. ආගමික සහනශීලීත්වය ප්‍රකට කරන මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)
2. "බුද්ධෝ" බුදුගුණය හඳුන්වන්න. (ලකුණු 04)
3. "ඉන්ද්‍රිය පරෝපරියත්ති ඤාණය" විස්තර කරන්න. (ලකුණු 06)
4. බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ නායකත්වය සනිදර්ශනව දක්වන්න. (ලකුණු 08)

02 1. "සුත්ත" යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02)
2. "ඕපනයිකෝ" ගුණය පැහැදිලි කරන්න. (ලකුණු 04)
3. බුදුදහම දෙවියන්ගේ පණිවිඩයක් නොවන බවට සාධක දෙකක් දක්වන්න. (ලකුණු 06)
4. ප්‍රායෝගික ජීවන දර්ශනයක් ලෙස බුදුදහම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

03 1. භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායේ පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)
2. "උජුපටිපන්න" ගුණය පැහැදිලි කරන්න. (ලකුණු 04)
3. **"සන්තුට්ඨස්සායං ධම්මෝ නායං ධම්මෝ අසන්තුට්ඨස්ස"** අර්ථ විවරණ සපයන්න. (ලකුණු 06)
4. භික්ෂු සංස්ථාවේ ප්‍රභවය හා විකාශය පැහැදිලි කරන්න. (ලකුණු 08)

### II කොටස

04 1. බ්‍රාහ්මණ යාගය පිළිබඳ විවරණයක් සපයන්න. (ලකුණු 08)
2. යාගය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 12)

05 1. නවරට සසුන් පිහිටුවීම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)
2. ධර්ම සංගායනා සසුනේ චිරස්ථිතියට හේතු වූ අන්දම පහදන්න. (ලකුණු 12)

06 1. ජීව පරිසරය ආරක්ෂා කිරීමට බුදුදහම ඉදිරිපත් කරන සංකල්ප මොනවාදැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 08)
2. අජීව පරිසර සංරක්ෂණයට බුදුදහමින් ලැබෙන අනුබලය පරීක්ෂා කරන්න. (ලකුණු 12)

07 1. කර්මය පිළිබඳ බෞද්ධ ආකල්පය පහදන්න. (ලකුණු 08)
2. "කර්මය හා පුනර්භවය" අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 12)

08 1. ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය පහදන්න. (ලකුණු 08)
2. ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ලකුණු 12)

බුද්ධ ධර්මය අනුමාන කොටුවේ පූජ්‍ය